

# 6

# ඉස්ලාමයේ යුතුකම්

වරක් නබි මුහම්මද් (සල්) තුමාණෝ තම සහාභාවරුන් සමග සිටියහ. එවිට ජිබ්රීල් අලයිහිස්සලාම් තුමා මිනිස් වෙසින් පැමිණ නබි (සල්) තුමා ඉදිරියෙහි ඉඳ ගත්තේය. ඉස්ලාම් යනු කුමක් දැයි නබි සල් තුමාගෙන් විමසුවේ ය. එයට නබි (සල්) තුමාණෝ ඉස්ලාම් යනු නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවකු නොවේ යැයි ද නබි මුහම්මද් (සල්) අල්ලාහ් ගේ වක්තෘන් යැයි  සාක්කි කීම (ෂහදා), සලාතය ඉටු කිරීම. සකාත් දීම, රමළාන් මාසයේ සව්මය ඉටු කිරීම, සහ හැකියාවක් ඇති අය හජ් වගකීම ඉටු කිරීමත් බව පිළිතුරු දුන්හ. මෙම හදීසයෙන් ඉස්ලාමයේ වගකීම් පහ පැහැදිලිව දක්වයි. ඒ පිළිබඳ තව දුරටත් බලමු.

## ෂහාදා

ෂහාදා යනු අයෙක් ඉස්ලාමය පිළිගැනීම සඳහා පවසන දිවුරුම් ප්‍රකාශය වන්නේ ය. සෑම කෙනකු ම මෙය පිරිසිදු සිතින් උසුරීම අත්‍යවශ්‍ය ය. 'ලාඉලාහ ඉල්ලල්ලාහු මුහම්මදුර් රසූලුල්ලාහ්' යැයි පැවසීම ෂහාදා වශයෙන් හැඳින්වෙන්නේ ය. මෙම කලිමාවෙහි අල්ලාහ් සහ ඔහුගේ  වක්තෘන් වහන්සේ විශ්වාස (ඊමාන්) කිරීම අන්තර්ගත ය.

අයෙකු මෙම කලිමාව පවසා ඉස්ලාමයෙහි ඇතුළත්වීම මගින් ස්වර්ගයට පිවිසීමේ වාසනාව ලබන්නේ ය. කවරෙකු ලාඉලාහ ඉල්ලල්ලාහු මුහම්මදුර් රසූලුල්ලාහ් යැයි පවසමින්  ඒ අයුරින් ම ක්‍රියා කරන්නේ ද ඔහු ස්වර්ගයට පිවිසෙන්නේය යැයි නබි සල්ලල්ලාහු අලයිහිවසල්ලම් තුමා පවසා ඇත. (බුහාරි මුස්ලිම්)

## සලාතය

ඉස්ලාම් පවසන වගකීම් අතර දෙවැනි වගකීම සලාතය වන්නේ ය. මෙය දිනපතාම පස්වේලක් නියමිත වෙලාව නොවරදවා ඉටු කිරීම සෑම මුස්ලිම්වරයෙකුගේ ම වගකීම වන්නේ ය. මේ ගැන නබි සල්ලල්ලාහු අලයිහිවසල්ලම් තුමා පහත සඳහන්



පරිදි පවසා ඇත. "මුස්ලිම් හා කාෆිර් අතර වෙනස සලාතය අතහැරීම වන්නේ ය" (බුහාරි)

වරක් ඉබ්නු අබ්බාස් රලියල්ලාහු අන්හු තුමා නබි සල්ලල්ලාහු අලයිහිවසල්ලම් තුමාගෙන් "මා ස්වර්ගයට පිවිසීමට මගාසලස්වන ඉබාදතයක් කියා දෙන්න" යැයි ඇසුවේ ය. එයට නබි සල්ලල්ලාහු අලයිහිවසල්ලම් තුමාණෝ "අල්ලාහ්ව නැමදින්නඃ ඔහුට කිසිවක් සම නොකරන්න, සලාතය සථාපිත කරන්න යැයි පැවසූහ." (බුහාරි)

## සකාත්

ඉස්ලාම් පවසන අනිවාර්ය වගකීම් අතර තුන්වැනි වගකීම සකාත් වන්නේ ය. මෙය සුදුසුකම් ලබන සෑම මුස්ලිම්වරයකු ම තම ධනයෙන් කොටසක් සකාත් ලැබීමට සුදුසුකම් ඇති පිරිසට ලබාදීම කළ යුතු ය. මෙයින් ධනය පිරිසිදු වන්නේ ය. නබි සල්ලල්ලාහු අලයිහිවසල්ලම් තුමා යෙමන් රාජ්‍යයට මුආද් රළියල්ලාහු අන්හු තුමා ආණ්ඩුකාරවරයා ලෙස යැවූ අවස්ථාවේ, අල්ලාහ් සකාතය වගකීමක් කර ඇත. එය ධනවතුන්ගෙන් ලබාගෙන දුප්පතුන්ට ලබා දිය යුතුයැයි පවසූහ. (බුහාරි, මුස්ලිම්)

## සව්මය

අල්ලාහ් විසින් පනවන ලද හතරවන  වගකීම සව්මය වන්නේ ය. සෑම මුස්ලිම් වරයකුම අවුරුදු පතා රමළාන් මාසයේ දී දිනපතා නියමිත වේලාවක් නොකා නොබී සහ සව්මය බිඳවන අනෙකුත් කාර්යයන්හි නො යෙදී අල්ලාහ් වෙනුවෙන් කුසල් බලාපොරොත්තුවෙන් සව්මය ඉටු කළ යුතු ය. සව්මය හේතුවෙන් පව් සමා කෙරෙන්නේ ය. සවර්ගයට පිවිසීමේ අවස්ථාව ලැබෙන්නේ ය.



"කවුරු රමළාන් මාසයේ දී ඊමානයෙන් යුක්තව ආනිසංස බලාපෙරොත්තුවෙන් සව්මය ඉටු කරන්නේ ද, ඔහුගේ සියලුම පව් සමා කෙරෙන්නේ ය"යැයි නබි සල්ලල්ලාහු අලයිහිවසල්ලාම්තුමාණෝ පැවැසූහ. (බුහාරි මුස්ලිම්)

## හජ්

ඉස්ලාම් නියම කර ඇති වගකීම් අතුරෙන් පස්වන වගකීම හජ් වන්නේ ය. පහසුකම්, අවස්ථාව සහ ශාරීරික ශක්තිය ඇති සෑම මුස්ලිම්වරයකුම තම ජීවිතයේ වරක් හෝ මෙම වගකීම ඉටු කිරීම අනිවාර්ය වන්නේ ය. මෙමගින් ඔහුගේ සියලු පව්වලට ම සමාව දෙනු ලැබ එදා උපන් ළදරුවකු ලෙස පාරිශුද්ධ අයෙකු වන්නේ ය.

"නිවැරදි ආකාරයට හජ් වගකීම ඉටුකිරීම සඳහා ස්වර්ගය හැර වෙනත් සම්මානයක් නොමැත" යැයි නබි සල්ලල්ලාහු අලයිහිවසල්ලම් තුමාණෝ පැවසූහ. (තිර්මිදි)

මෙම වගකීම් අතර පරස්පර සම්බන්ධතාවයක් දක්නට ඇත. මේවා ඉටුකිරීමෙන් තනි මිනිසුන් අතර ද එමෙන්ම සමාජය අතර ද සම්බන්ධතා දැඩි වන්නේ ය.

එම නිසා ඉස්ලාම් පවසන යුතුකම් නිවැරදි අයුරින් ඉටුකිරීමෙන් අල්ලාහ්ගේ ආදරයත් අනුමැතියත් ලබා ගනිමු.

අභ්‍යාස

පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. ඉස්ලාම් පිළිබඳව නබි සල්ලල්ලාහු අලයිහිවසල්ලම් තුමාගෙන් විමසුවේ කවු ද ?

2. සලාතයේ වැදගත්කම අවධාරණය කරන හදීසයක් සඳහන් කරන්න.

3. ධනය පිරිසිදු කරන යුතුකම කුමක් ද?

4. ෆර්ල් වූ සව්ම සමාදන් වන්නේ කුමන මාසයේ ද ?

5. අනුමත කරන ලද හජ් යුතුකමට අල්ලාහ් විසින් දෙනු ලබන සම්මානය කුමක් ද ?